පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය

වෙළුම 6, අංක 1 | 2002 මැයි - ජුනි

# පැණි කොමඩු ජෑම්

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පැණි කොමඩු නමින් කොමඩු ප්‍රභේදයක් නිර්දේශ කර ඇත. එය වියළි කලාපයේ බහුල ලෙස වගාවේ. කෙසේ නමුත් වාරයේදී වැඩි අස්වැන්න නිසා අඩු මිලක් ලැබෙන අතර, සමහර විට කුණුවූ ගෙඩි විශාල වශයෙන් වෙළෙඳපොළවල් ආසන්නයේම විසි කර තිබෙනු දැකිය හැකිය. පැණි කොමඩු කල්තබා ගැනීමේ ක්‍රමයක් ලෙසට ජෑම් නිපදවිය හැකි අතර ඒවා ස්ට්‍රොබෙරි ජෑම් වලට සමාන ආකර්ශනීය පෙනුමෙන් යුතුවේ.

### අවශ්‍ය ද්‍රව්‍ය.

| | | |
|---|---|---|
| පිරිසිදු කල පැණි කොමඩු (පොතු හා ඇට ඉවත් කළ) | කි.ග්‍රෑ. | 01 |
| සීනි | කි.ග්‍රෑ. | 01 |
| සිට්‍රික් අම්ලය | තේ හැඳි | 02 |
| පෙක්ටින් | ග්‍රෑ. | 12 |

### ක්‍රමය.

කොමඩු ගෙඩිය පිරිසිදුකර පොතු හා ඇට ඉවත්කර කුඩා කැබලි වලට කපාගන්න. ඇට හා පොතු ඉවත් කළ කොමඩු කැබලි පොඩිකර ගැනීමට බ්ලෙන්ඩරයක් භාවිතා කළ හැක. පොඩිකරගත් පළතුරු භාජනයකට දමා ලිප තබා රත් කරන්න. තරමක් උණුසුම් වූ පසුව සීනි එකතු කරන්න. පෙක්ටින් හා සිට්‍රික් අම්ලය මිශ්‍රකර සීනි - පළතුරු මිශ්‍රණයට එක් කරමින් රත් කිරීම දිගටම කරන්න. ජෑම් පදම දැනගැනීම සඳහා වීදුරුවකට වතුර දමා ජෑම් ස්වල්පයක් සෙමින් එයට දමන්න. ජෑම් දිය නොවී වීදුරුව අඩියට ගමන් කළේ නම් එම මිශ්‍රණය සුදුසු පදමට පැමිණ ඇති බව පෙන්නුම් කරයි. රත් කිරීම නවත්වා ජීවානුහරිත බෝතල්වලට දමා සීල් කරන්න.

නියමිත පදමට පැමිණි ජෑම්වල බ්‍රික්ස් අගය 68.5 ක් විය යුතුය. මේ නිසා ජෑම්වල නියම පදම දැනගැනීම සඳහා බ්‍රික්ස් මීටරයද භාවිතා කළ හැකිය.

පැණි කොමඩු 80% ක් හා ස්ට්‍රෝබෙරි 20% ක් යන අනුපාතයට මිශ්‍රකර ස්ට්‍රෝබෙරි රසය සහිත ජෑම් පිළියෙල කරගත හැකිය.

**මූලාශ්‍රය:** *එම්.පී මංගලිකා දිසානායක මිය, කෘෂිකර්ම උපදේශිකා, ආහාර පර්යේෂණ ඒකකය, ගන්නෝරුව.*

# ආහාරමය කෙඳි - ආහාර වේලට අත්‍යවශ්‍යයෙන්ම එක් කළ යුතු සංඝටකයක්

කෙඳි අත්‍යවශ්‍ය පෝෂකයක් නොවුවත් විවිධ පෝෂක විශේෂඥයින් හා සංවිධාන රාශියක්, ආහාරමය කෙඳි ග්‍රෑම් 25-30 ක් දිනපතා ආහාරයට එක්කර ගැනීම නිර්දේශ කරයි. එවැනි නිර්දේශයන් සහ පෙර කරන ලද පර්යේෂණ වලට අනුව විවිධ ආකාර පිළිකා අවදානම් අඩු කිරීම සඳහා කෙඳිවල කාර්ය භාරය සඳහන් කර තිබුනත් සාමාන්‍ය ඇමරිකානුවෙක් පරිභෝජනය කරනුයේ දිනකට කෙඳි ග්‍රෑම් 10 - 15 ක් පමණක් බව සඳහන් වේ.

ඔබ දැනටමත් ප්‍රමාණවත් ලෙස කෙඳි ආහාරයට එක්කර නොගන්නේ නම් පහත පර්යේෂණ ප්‍රතිඵල සලකා බලන්න. ජාත්‍යන්තර පිළිකා සඟරාවකට අනුව පිළිකා රෝගීන් 902 ක් පාලක පුද්ගලයන් 1950 ක් සමඟ සංසන්දනය කරන ලදි. මෙම පිළිකා රෝගීන් අතුරින් 271 ක් මුඛ පිළිකා රෝගීන්ද, 327 ක් ග්‍රසනිකාව ආශ්‍රිත පිළිකා රෝගීන්ද, 304 ක් අන්නනාලිකාව ආශ්‍රිත පිළිකා රෝගීන්ද විය. ප්‍රතිඵල වලට අනුව පලතුරු, එළවළු සහ ආහාරමය කෙඳි බහුල සම්පූර්ණ ධාන්‍ය සහිත ආහාර අනුභව කරන රෝගීනට කෙඳි අඩු ආහාර වේල ගන්නා රෝගීනට වඩා මුඛය හා උගුර ආශ්‍රිත පිළිකා අඩු බව පෙනුණි.

පළතුරු, එළවළු සහ සම්පූර්ණ ධාන්‍යමය ආහාරවල ඇති ද්‍රාව්‍ය කෙඳි සහ බීජ හා පළතුරු ලෙල්ලේ ඇති අද්‍රාව්‍ය කෙඳි යන දෙවර්ගයම ආරක්ෂක වේ. මෙම ප්‍රතිඵල ගැහැණු පිරිමි දෙපක්ෂයටම පොදු විය.

කෙඳි බහුල ආහාර ගැනීමත්, මස්, සන්තෘප්ත මේදය සහ කොලොස්ටරෝල් අධික වෙනත් ආහාර අඩු කිරීමත් වෙනත් මේදය අඩු පලතුරු හා එළවළු ආහාරයට එක්කර ගැනීමත් සෞඛ්‍යමය ජීවිතයකට මඟපාදන බව පර්යේෂකයින් තවදුරටත් පෙන්වා දෙයි.

***Source: Internationl Journal of Cancer, January 2001 Vol. 91,PP 283- 287.***

# ගම්පහ දිස්ත්‍රික්කයේ වී වගා කරන කුඹුරු බිම් බෝග විවිධාංගීකරණය කිරීම.

වී වගා ක්ෂේත්‍ර අත්හැරීම නිසා ශ්‍රී ලංකාවේ වී වගා කරන බිම් ප්‍රමාණය පසුගිය දශක කීපය තිස්සේ සීඝ්‍රයෙන් අඩුවෙමින් පවතී. වී වගා ක්ෂේත්‍ර අතහැරීම කලාපයෙන් කලාපයට වෙනස් වේ. සමාජ - ආර්ථික, වෙළෙඳපොල, ජෛවමය, භෞතික සහ පාරිසරික සාධක ඇතුළුව විවිධ සාධක මෙයට බලපා තිබේ. අනෙකුත් ප්‍රදේශ හා සසඳන විට පහතරට තෙත් කලාපයේ මෙම තත්වය වඩාත් බහුලවේ. ගම්පහ දිස්ත්‍රික්කයේ වි වගා කළ බිම් ප්‍රමාණයෙන් 12% ක් 2000 යල කන්නය තුළ අඩුවූ අතර 2000/2001 මහ කන්නය තුල එය 60% ක් විය. 70 දශකය හා සසඳන විට බෝග තීව්‍රතාවයේ 82% ක පමණ අඩුවීමක් වේ.

සහල් වලින් ස්වයංපෝෂිත තත්වයට අප පා තබා සිටින බව පවසන නමුත් විශාල සහල් ප්‍රමාණයක් තවමත් අපි ආනයනය කරන්නෙමු. ඒ හා සමානව බොහොමයක් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය රාශියක්ම ස්වයංපෝෂිත තත්වයට වඩා පහල මට්ටමක සිටින්නෙමු. ඒක පුද්ගල ලබාගත හැකි, වගා කල හැකි බිම් ප්‍රමාණය ඉතා පහල මට්ටමේ (හෙක්. 0.13) පැවතීම රැකියා විරහිත තරුණ තරුණියන් දහස් ගණන් සිටීම සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීමේ නිරන්තර ගැටළු පවතින බවට අප දැනුවත්ව සිටියදීත් ඵලදායිතාවයෙන් ඉහළ බිම් විශාල ප්‍රමාණයක් පුරන්වීමට හැරීම පුදුමයට කරුණක් වේ.

මේ නිසා නැවත ගම්පහ දිස්ත්‍රික්කය තුළ මෙවැනි වගා බිම් ඵලදායිතාවයට ගෙනඒම සඳහා යොදා ගත හැකි ක්‍රම සහ විධි සොයා බැලීම සඳහා අධ්‍යයනයක් පේරාදෙණිය ස්වභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය මගින් 1997 වසර සිට ක්‍රියාත්මක කරන ලදී.

මෙම පුරන්වූ කුඹුරු බිම් වල වී වගාව වෙනුවට බෝග විවිධාංගීකරණය එක් ක්‍රමයක් ලෙස තෝරා ගන්නා ලදී. මේ අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ අත්හැර දමන ලද වී වගා බිම් බෝග විවිධාංගීකරණය කිරීමේ හැකියාව හා පැන නගින ගැටළු සහ සුදුසු බෝග, බෝග සංයෝග සහ භූමි භාවිත ක්‍රියාකාරකම් පිළිබඳව සොයා බැලීම විය.

## බෝග විවිධාංගීකරණයේ ගැටළු

බෝග වගා කිරීම සඳහා ජලය හිඟකම මූලික ගැටළුවක් වන අන්තර් මාධ්‍ය හා වියලි කළාපයේ සමහර ප්‍රදේශවල බෝග විවිධාංගීකරණය බහුල ලෙස භාවිත වේ. කෙසේ නමුත් තෙත් කලාපයේ වී වගා බිම් වලට ජලය ගැටළුවක් නොවන අතර, වසර පුරා ස්වභාවික ජල සම්පත් ක්‍රියාත්මක වේ. ස්ථිර ජල සැපයුමක් බෝග වගාව සඳහා තිබීම ඉතා වාසිදායක වුවත් මෙම ඉඩම්වල ගොඩ බෝග වගා කිරීමේදී මුහුණදෙන ප්‍රධානතම ගැටළුව දුර්වල ජලවහන තත්වය වේ. අනෙකුත් ගැටළු අතුරින් ගං වතුර සහ වර්ෂාව සහිත කාලගුණ තත්වය ප්‍රධාන තැනක් ගනී.

## සුදුසු බෝග තේරීම

විවිධ ජල විද්‍යාත්මක තත්ව හේතුවෙන් දෙන ලද වී වගා යායක් තුල විවිධ වී වගා පරිසර තත්ව දක්නට ලැබේ. ඉහළ මිටියාවත්, බෑවුම් සහිත මිටියාවත්, ජලවහනය සැළසුම් කළ හෝ නොමැති පහත් මිටියාවත්, හා එකිනෙකට සම්බන්ධ වූ මිටියාවත් මේ අතුරින් හඳුනාගත් එක් වගා යායක් තුල දැකිය හැකි විවිධ වී වගා පරිසර තත්වයන් සමහරකි. භූ විෂමතාව, පාංශු සච්ඡිද්‍රතාව, පාංශු සාරත්වය ආදිය මෙවැනි විවිධ පරිසර තත්ව ඇති වීමට හේතු වේ. ඉහල මිටියාවත්වල පස බොහෝවිට රළු වයනය සහිත වන අතර එයට පහලින් ඇති වී වගා ක්ෂේත්‍රයෙන් ක්‍රමයෙන් සිහින් වයනය සහිත පස් බවට අනුක්‍රමයෙන් වෙනස් වී ඇත. මේ අනුව වී වගා පරිසරවල ඇති සහජ ගුණාංග නිසා බෝග විවිධාංගීකරණය සියළුම වී වගා පරිසර තත්ව සඳහා භාවිතා කළ නොහැකිබව මෙයින් පෙන්නුම් කරයි.

බෑවුම් සහිත ඉහල මිටියාවත්, මිටියාවත් බෑවුම්, ජලවහනය සහිත මිටියාවත් සහ ගංගා නිම්න (river levis) ගොඩ බෝග වගා කිරීම සඳහා සුදුසු බව අත්දැකීම් තුළින් පෙන්නුම් කර ඇත. මෙවැනි පරිසර තත්ව තුළ විවිධ ජලවහන තත්ව හා වයන සහිත රළු වයනය සහිත වැලි ලෝම හෝ ඇලුවියල් පස දක්නට ලැබේ. ජලයෙන් යටවීමේ තත්වයෙන් තොරවීමට සහ ඉක්මණින් ජලවහන තත්ව දියුණු කරගත හැකිවීම මෙවැනි බිම්වල පවතින පාංශු වයනය හා භූ විෂමතාවය නිසා හැකිවීම ප්‍රධානතම වාසිදායක තත්වය වේ.

## වගා පාත්තිවල විශාලත්වය, පැළ සිටුවීමේ කාලය, වාරි ජල සම්පාදනය සහ බෝග වල හැසිරීම.

මෙම තෝරාගත් භූමිවල වැඩිපුර ජලය බැසයාමට සැලැස්වීම සඳහා පාත්ති මීටර 1 ක් පළලට තිබීම සහ ජලවහන කානු සෙ.මී. 30- 45 ක් ගැඹුරට බෑවුම ඔස්සේ සැකසීම ප්‍රමාණවත් වේ. කෙසේ නමුත් පාත්තිවල ප්‍රමාණය හා ජලවහන කානුවේ ගැඹුර වගා කරන බෝගය, පිහිටීම සහ වගා කාල සීමාව මත රඳා පවතී. 1960 සිට 1999 දක්වා සෙනරත්ගොඩ කාලගුණ විද්‍යා ඒකකය මගින් ලබාගත් වර්ෂාපතන දත්ත අනුව සතියකට මී.මී. 10 කට වඩා අඩු වර්ෂාපතනයක් ලැබීමේ 75% සම්භාවිතාවය දක්නට ලැබුනේ දෙසැම්බර් මස මැද සිට අප්‍රේල් මුල දක්වා කාලය සහ ජූනි මැද සිට සැප්තැම්බර් මුල දක්වා කාලසීමාවන් තුළ වේ. වර්ෂාපතන පැතිරීමේ රටාවට අනුව, මෙම කාලසීමා තුල ක්ෂණික ගං වතුර තත්ව ඉතාමත් කලාතුරකින් ඇතිවුන අතර, මෙම කාලසීමාවන් වී වගා බිම්වල ගොඩ බෝග වගා කිරීම සඳහා වඩාත් යෝග්‍ය වේ.

පර්යේෂණයට අනුව මෙම කාලසිමාවේදී බෝගවල හැසිරීම අනෙකුත් ප්‍රදේශ හා සංසන්දනාත්මක ඉතා සතුටුදායක විය. ජනවාරි අග කාලයේ සිට අප්‍රේල් මැද දක්වා සහ ජූනි මැද කාලය තුළ ජලය හිඟ වූ අතර

මේ කාලය තුළ අමතර ජල සම්පාදනය අවශ්‍ය වේ. පෙබරවාරි සිට මාර්තු දක්වා කාලය තුළ භූගත ජල මට්ටම මතුපිට සිට මීටර් 1- 1.5 ක් පමණ පහලින් පැවතුණි. ඇල මාර්ගවල ජලය මෙම කාලය තුළ ගලා යන බැවින් මේවායින් අමතර ජල සම්පාදනය කිරීම ගැටළුවක් නොවේ. දෙසැම්බර් මස මුල් කාලය තුළදී බෝග ස්ථාපනය කළ හැකි අතර, එම බිම් මහ කන්නයේදී සහ යල කන්නයේ මාර්තු මැද සිට ජුනි මැද දක්වා පුරන්ව පවතී. දෙසැම්බර් අවසානයේ සිට ජනවාරි කාලයේ බෝග පිහිටුවීම සහ ගැඹුරු කානු මගින් ජලය අනවශ්‍ය ලෙස වහනය කිරීම නිසා පස වියලීයාම ජනවාරි අග සිට මාර්තු කාලය දක්වා සිදුවේ. මේ නිසා වර්ෂාපතන රටාව, පාංශු වයනය හා භෞතික විෂමතාවය මත ජලවහන කානුවල ගැඹුර රඳා පවතී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශිත අනෙකුත් සෑම ශෂ්‍ය ක්‍රියාවක්ම භාවිතා කළ හැකිය. අකාබනික පොහොර පමණක් යෙදීමට වඩා කාබනික පොහොර (විශේෂයෙන් කුකුළු ගොම්පල පොහොර) භාවිතයෙන් වඩා හොඳ බෝග වර්ධනයක් වූ බව පරීක්ෂණයේදී පෙන්නුම් කරන ලදී.

**සුදුසු බෝග හා ඒවායේ ආදායම් තත්වය**

බණ්ඩක්කා, රාබු, පතෝල, කරවිල, මෑ, බුෂිටාවෝ, මාළු මිරිස්, බටු, මිරිස්, පිපිඤ්ඤා වැනි එළවළු බෝගත්, මුකුණුවැන්න, කන්කුන්, තම්පලා, සාරන සහ නිවිති වැනි පලා වර්ගත් මෙම කුඹුරු බිම් සඳහා යෝග්‍ය විය.

මේවායේ අස්වනු වෙනත් ප්‍රදේශ හා සංසන්දනාත්මක විය. මෙයට අමතරව කෙසෙල්, පැපොල් වැනි පළතුරු බෝගත්, බතල වැනි අල බෝගත් මෙම භූමිවලදී ඉහල අස්වනු ලබාදුනි. කිරි ඉරිඟු සඳහා බඩ ඉරිඟු වගාවද මෙම භූමි තුළ ඉතා සාර්ථක විය.

දීයාවල ප්‍රදේශයේ ගොවීහු බණ්ඩක්කා වගාවෙන් අක්කරයට රු: 64000/=, 59000/= හා, 78000/= ක පමණ ලාබයක් ලබා ගත්හ. පතෝල වගාකළ ගොවීන් තිදෙනෙකු පිළිවෙලින් රු: 96,000/=, 117,000/= සහ 123,000/= ක ලාබයක් ලබා ගත්තෝය. මෙම ලාබයට පවුලේ ශ්‍රමය අයත් වේ.

**මූලාශ්‍රය:** ***කේ.එම්.සෙනෙවිරත්න බණ්ඩා, පර්යේෂණ නිලධාරී, ස්වභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය, පේරාදෙණිය.***

# පශ්චිම අංගමාරයට ප්‍රතිරෝධී අල ප්‍රභේදයක් හිල්ස්ටාර් (Hillstar)

අර්තාපල් යනු ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයාට මෙන්ම නිෂ්පාදකයාට ද වැඩි වටිනාකමක් සහිත බෝගයකි. එමෙන්ම එය බොහෝ රෝගවලට පාත්‍ර බැවින් වැඩි අවදානමක් සහිත බෝගයක් ද වේ. අර්තාපල් වගාවට වැළඳෙන පශ්චිම අංගමාරය ශ්‍රී ලංකාවට පමණක් නොව මුළු ලෝකයේම අර්තාපල් වගාවට බලපාන භයානක රෝගයක් වේ.

මෙම රෝගය පයිටොප්තෙරා ඉන්ෆෙස්ටාන් නැමැති දිලීරය නිසා ඇතිවේ. මෙය බෝගයේ ඕනෑම අවස්ථාවක ආසාදනය විය හැකි අතර, මේ නිසා අස්වනු හානිය 100% ක් විය හැක. සුළං, මීදුම සහ තෙත් කාලගුණය මෙම රෝගය පැතිරීම සඳහා වඩාත් ප්‍රසස්ථ තත්ව වේ. මෙම තත්වය අර්තාපල් බහුලව වගාවෙන උඩරට ප්‍රදේශයේ බොහෝ කාලසීමාවල දක්නට ලැබේ. මේ නිසා ගොවින් කෘෂි රසායන බහුල ලෙස භාවිතා කරන අතර රුපියල් 27,000/- සිට රු: 42,000/- ක වියදමක් කෘෂි රසායන සඳහා වැය කරති. මේ නිසා ඵලදායිතාව නැංවීම සඳහා පාත්‍ර ප්‍රභේද වෙනුවට ප්‍රතිරෝධී ප්‍රභේද භාවිතය වඩාත් ආර්ථිකමය හා ප්‍රයෝගික ක්‍රමය වේ.

80 දශකයේ මුල් කාලයේදී ජාත්‍යන්තර අර්තාපල් ආයතනයෙන් දර්ශ 300 කට වඩා වැඩි ප්‍රමාණයක් පසු අංගමාර ප්‍රතිරෝධීතාව අධ්‍යයන කිරීම සඳහා හඳුන්වා දෙන ලදී. මූලික වර්ෂයේදී වඩා ප්‍රමුඛ දර්ශ තේරීම කර, නැවත ගුණනය කර ඒවායේ ප්‍රතිරෝධීතාව අධ්‍යයනය කරන ලදී. ක්‍රමයෙන්, වසර ගණනාවක් තිස්සේ මේවායේ ප්‍රතිරෝධීතා මට්ටම්, ප්‍රතිරෝධීතාව බිඳවැටීම, තෝරාගත් ප්‍රභේදවල අස්වනු විභව පිළිබඳව පර්යේෂණ ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකර ප්‍රදේශවලදී අධ්‍යයනය කරන ලදී.

පසුගිය වසර 10 තුළ තෙත් හා වියලි කාලවල පැවැත්වූ පරීක්ෂණ වලට අනුව 34/8 වරණය පශ්චිම අංගමාරයට ඉහල ප්‍රතිරෝධීතාවයක් දක්වන බැවින් දිලීර නාශක ඉසීම කළ හා නොකළ යන තත්වයන් දෙකේදීම ඉහල අස්වනු විභවයක් හඳුනා ගන්නා ලදී.

සමහර අර්තාපල් ප්‍රභේද පසු අංගමාරයට දක්වන ප්‍රතිරෝධීතාව විවිධ පරිසර තත්ව තුළදී බිඳ වැටීම දක්නට ලැබේ. නමුත් 34/8 වරණය වියලි හා තෙත් තත්ව දෙකේදීම ස්ථාවර ප්‍රතිරෝධී මට්ටමක් පෙන්වන ලදී.

මේ අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රභේද නිර්දේශ කිරීමේ කමිටුව මෙය "හිල්ස්ටාර්" නමින් වගා කිරීම සඳහා නිර්දේශ කරන ලදී. මෙය සීඝ්‍ර වර්ධන විලාශයක් සහිත මධ්‍යස්ථ උස, ඝනකම් පැළෑටි ව්‍යුහය සහ වැඩි පරිනත කාලයක් (දින 105) මෙහි ප්‍රභේදාත්මක ලක්ෂණ වලට අයත් වේ. ක්‍රීම් පැහැති පොත්ත සහිත රවුම් සිට ඕවලාකාර හැඩති අල සහිත වේ. කහමය සුදු මාංශලයෙන් සමන්විත අලයෙහි පිටත නොගැඹුරු ඇක්ෂි සහිත වේ.

ගොවි ක්ෂේත්‍ර මට්ටමේදී හෙක්ටයාරයකට ටොන් 27 ක සාමාන්‍ය අස්වැන්නක් මෙම ප්‍රභේදය ලබා දුන් අතර, ජාතික සාමාන්‍ය අර්තාපල් අස්වැන්න හෙක්ටයාරයකට ටොන් 12 ක් පමණ වේ.

සීතාඑළිය විශේෂ අර්තාපල් බීජ නිෂ්පාදන වැඩ සටහන යටතේ මෙම ප්‍රභේදයේ $G_0$ අල කිලෝ ග්‍රෑම් 1500 ක් නිපදවන ලදී. එම අල 2002/03 මහ කන්නයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු බීජ ගොවිපලවල සිටුවා G1 අල නිපදවා පරම්පරා 2-3 ක ගුණන ක්‍රියාවලියක් තුළින් ගොවීන්ට ලබාදීමට සැලසුම් කර ඇත.

**මූලාශ්‍රය:** ***ඒ.ජී.සී.බාබු, ශාක ව්‍යාධි විද්‍යාඥ, කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, සීතාඑළිය.***

# කෙසෙල් පැළ විනාශ කිරීමට රසායන ක්‍රමයක්

කෙසෙල් පැළ වලට යම් ආසාදනයක් වූ විට හෝ වගාවේ ඵලදායිතාව අඩුවූ විට එම වගාව ගලවා ඉවත් කිරීම අවශ්‍ය වේ. පැළ ගලවා ඉවත් කිරීම කම්කරු ශ්‍රමය අධිකව වැයවන ක්‍රමයකි. එම නිසා එය ආර්ථිකමය

ක්‍රියාවලියක්ද නොවේ. මේ නිසා අනවශ්‍ය කෙසෙල් පැළ ඉවත් කිරීමට පහසු ක්‍රමයක් සොයා ගැනීම සඳහා පර්යේෂණ අඟුණකොළපැලැස්ස මාෂ බෝග හා තෙල් බෝග පිළිබඳ පර්යේෂණ මධ්‍යස්ථානය මගින් පවත්වන ලදී.

ප්‍රතිඵල වලට අනුව 2-4 ඩී (ඩයි - හෙඩනොල්) මිලි ලීටර් 3-5 ක් පැළයේ පාදස්ථයට විදීම වඩාත් කාර්යක්ෂම හා ආර්ථිකමය පැළ ඉවත් කිරීමේ ක්‍රමය ලෙස හඳුනා ගන්නා ලදි. මි.ලී. 15 ප්‍රමාණයේ සිරින්ජයකින් මෙම රසායන ද්‍රව්‍ය ශාකයට විදීම පහසුවෙන් කළ හැකිවේ. මෙම ක්‍රමයෙන් පැළයට සම්බන්ධ සියළුම මොරෙයියන්ද විනාශ වේ. සති 1-2 ක් තුළ විදීම සිදුකල 2-4 ඩී ප්‍රමාණය මත කෙසෙල් පැළ වියළීම හා කඳ වියලීයාම සිදුවේ. රසායන ද්‍රව්‍ය යෙදීමෙන් මාස 02 කට පසු ක්ෂේත්‍රය සී සෑම කළ හැකිය.

පහසු බවට අමතරව මෙම ක්‍රමයෙන් කඳ ගුල්ලන් හා අල ගුල්ලන්ද විනාශ වන බැවින් එම කෘමීන්ගේ හානිය පැතිරීම ද සිදු නොවේ.

*මූලාශ්‍රය: එස්.එස්.වීරසිංහ, පර්යේෂණ නිලධාරී හා කේ.එච්.රුවන්පතිරණ, පර්යේෂණ සහකාර, මාෂ බෝග හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, අඟුණකොළපැලැස්ස.*

# කෙසෙල් වගාවනට මූලික පොහොර යෙදීම

අළුතින් සිටවූ කෙසෙල් වගාවකට පළමුවෙන්ම රසායනික පොහොර යෙදීම පැළ සිටුවා මාස 2 කට පසු සිදුකරනු ලැබේ. මෙලෙස පොහොර යෙදීම ප්‍රමාද කිරීමට බොහෝ දුරට හේතුවිය හැක්කේ කෙසෙල් අල ගුල්ලා (කොස්මොපොලිටස් සෝඩිඩස්) හානිය නිසා විනාශ වූ කොටස් සියල්ල කපා දමා සිටුවීම කරන බැවින් පැළ සිටුවන අවස්ථාවේ මුල් කිසිවක් නොතිබීම විය හැකිය.

නිරීක්ෂණ වලට අනුව පැළ සිටුවා සතියකට පසුව පාමුල ප්‍රදේශයේ මුල් වර්ධනය ආරම්භවන අතර ක්‍රමයෙන් කෝමයේ පහල කොටස්වල මුල් වර්ධනය වේ. මතුවූ මුල් සීඝ්‍රයෙන් වර්ධනය වන අතර, දින කීපයක් තුළ මූලකේශ ජාලාවක් වර්ධනය දක්නට ලැබේ. පැළයේ තිබෙන මුල් සමඟ පැළයක් සිටවූ විට එම මුල් වල හානිවූ කෙලවර මූලකේශ හට ගැනීම ආරම්භ වේ. කෝමය අනවශ්‍ය ලෙස කපා ඉවත් කිරීම කළ විට මාස 02 කටත් වඩා මුල් හටගැනීම ප්‍රමාද වේ.

මේ නිසා පැළ සිටවූ කෙටි කාලයකින්ම මුල් හටගන්නා බව පැහැදිලි අතර මෙම මුල් වලට අවට මාධ්‍යයෙන් පෝෂක අවශෝෂණය කරගත හැකිවේ. මූලික පොහොර යොදා සිටවූ කෙසෙල් පැළ මූලික වර්ධන අවධියේ ශක්තිමත් සීඝ්‍ර වර්ධනයක් පෙන්වන ලදී. මේ නිසා කෙසෙල් පැළ සිටුවන අවස්ථාවේ මූලික පොහොර යොදා සිටුවීම විශාල කැන් ලබාගැනීම සඳහා සීඝ්‍ර වර්ධනයක් වාසිදායක වන විශේෂයෙන් කෙසෙල් වාර්ෂික වගාවක් ලෙස භාවිතාවන වගාවන් වලදී භාවිතා කළ හැකිවේ.

*මූලාශ්‍රය. පී.වීරසිංහ සහ එස්.එස්. වීරසිංහ ,පර්යේෂණ නිලධාරී, මාෂ බෝග හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, අඟුණකොළපැලැස්ස.*

**කෘෂි - තාක්ෂණ ....... ලුහුඬින්**

කාලීන තාක්ෂණික තොරතුරු සංක්ෂිප්තව තාක්ෂණවේදීන්, විශේෂයෙන්ම ව්‍යාප්ති නිලධාරීන් වෙත ලබාදීමේ අරමුණ උදෙසා කෘෂි - තාක්ෂණ පත්‍රිකාව ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය විසින් වරින් වර නිකුත් කරනු ලැබේ. මෙම පත්‍රිකාවේ අඩංගු තොරතුරු බොහොමයක්ම ප්‍රභවය වී ඇත්තේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ ආයතන සහ මධ්‍යස්ථාන වලිනි. තවද, වෙනත් ඕනෑම මූලාශ්‍රයකින් උපුටා ගත හැකිවූද, ක්ෂේත්‍රයේ ප්‍රායෝගිකව යොදාගත හැකිවූද, තොරතුරු වේ නම්, එවැනි දෑ ද කෘෂි - තාක්ෂණ පත්‍රිකාවෙහි අන්තර්ගත වනු ඇත.

*- සංස්කාරක -*

*සංස්කරණය*
**පී. වාසුදේවා**

*පරිවර්තනය*
**ජයන්තා ඉලන්කෝන්**

වැඩිදුර තොරතුරු සඳහා විමසන්න : අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, තැ.පෙ. 18, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය මගින් ප්‍රකාශයට පත් කෙරිනි.

**රා.සේ.පි.**

**මුද්‍රිත ද්‍රව්‍යය**

**භාර නොදුනහොත් ආපසු යොමු කරන්න:**

**අධ්‍යක්ෂ,**
**ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය,**
**තැ.පෙ. 18,**
**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,**
**පේරාදෙණිය.**

මෙම පත්‍රිකාව, පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ පරිගණක අංශයේ පිටු සකස් කර ගන්නෝරුව කෘෂිකර්ම මුද්‍රණාලයේ දී මුද්‍රණය කරන ලදී.